# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1980 අංක 22 දරන
# බෞද්ධ විහාර දේවාලගම්
# (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කලේ 1980 මැයි මස 13 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදි.

1980 මැයි මස 16 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදි.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදි

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : ශත 20 යි    තැපැල් ගාස්තුව : ශත 35 යි

# 1980 අංක 22 දරන බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1980 මැයි මස 13 වන දින]

එල්. ඩී.—ඕ. 22/80.

**බෞද්ධ විහාර දේවාලගම් ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 1980 අංක 22 දරන බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*ලුහුඬු නාමය.*

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) බෞද්ධ විහාර දේවාලගම් ආඥාපනතේ 14 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

*318 වන අධිකාරයේ 14 වන වගන්තිය සංශෝධනය කිරීම.*

(1) "භාරකරුවකු ලෙස පත් කරනු ලැබීම හෝ එසේ පත් කරනු ලැබුවහොත් ඔහු භාරකරුවකු ලෙස ක්‍රියා කිරීම හෝ නොකළ යුතුය" යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

"භාරකරුවකු ලෙස තෝරා පත් කර ගනු ලැබීමට හෝ පත් කරනු ලැබීමට නැතහොත් තෝරාපත් කරගනු ලැබුවහොත් හෝ පත් කරනු ලැබුවහොත් භාරකරු ලෙස ක්‍රියා කිරීමට හෝ සුදුස්සකු නොවිය යුතුය."; තවද

(2) (ආ) ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(ආආ) යම් වෘත්තියක්, රක්ෂාවක් නැතහොත් කර්මාන්තයක් කිරීමට හෝ යම් වෘත්තියක, රක්ෂාවක නැතහොත් කර්මාන්තයක නිරත වීමට හෝ කිසියම් ලිඛිත නීතියක විධිවිධානවලින් හෝ විධිවිධාන යටතේ ඔහු නුසුදුස්සෙක්ව සිටී නම්;".

**3.** මේ පනතේ 2 වන වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට කරන ලද සංශෝධනය, ප්‍රධාන ප්‍රඥප්තිය ක්‍රියාත්මක වූ දිනයෙහි සිට ක්‍රියාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

*සංශෝධනය අතීතයටත් බලපෑ යුතු බව.*

**4.** මේ පනත ආරම්භ වීමට පෙරාතුව, භාරකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරන ලද යම් ක්‍රියාවක්, මේ පනතෙහි සඳහන් කිසිවකින් බල රහිත නොවිය යුතු ය ; නැතහොත් බලරහිත යයි සලකනු නොලැබිය යුතු ය.

*අත් හැරීම.*

ජ 49301—10,600(80/04)

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 කි. (විදේශීය) රු. 40 කි. කොළඹ 1 තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා දායකත්ව ලබාගත හැකිය. මුදල් ගෙවූ දිනට කලින් නිකුත් කරන ලද පනත් කෙටුම්පත් සහ නීති නොසැපයීමේ කොන්දේසිය මත ප්‍රමාද දායක මුදල් භාරගනු ලැබේ.